SRI LANKA

# histories that connect

සබැඳි ඉතිහාසය

இணைந்த வரலாறுகள்

# වාචික ඉතිහාසය ඉගැන්වීමේ උපාය මාර්ග

--------

## පන්ති කාමරය තුළ වාචික ඉතිහාසය භාවිත කිරීම හඳුන්වාදීමේ මාර්ගෝපදේශයකි




බ්‍රිජට් මාටින් සහ ජුඩිත් පෙරේරා

# වාචික ඉතිහාසය ඉගැන්වීමේ උපාය මාර්ග

## පන්ති කාමරය තුළ වාචික ඉතිහාසය භාවිත කිරීම හඳුන්වාදීමේ මාර්ගෝපදේශයකි

බ්‍රිජට් මාටින් සහ ජුඩිත් පෙරේරා

### බ්‍රිජට් මාටින්

බ්‍රිජට් 2012 වසරේ සිට ඉතිහාස ගුරුවරයෙකු වශයෙන් කටයුතු කරන අතර 2019 වසරේ සිට EuroClio සමඟ සම්බන්ධ වී ගුරු උපදේශකවරයෙකු ලෙස කටයුතු කරයි. බ්‍රිජට් අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (ද්විතියික) සහ ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබේ. බ්‍රිජට් විසින් වාචික ඉතිහාසය ඉගැන්වීම පිළිබඳ ලිපියක් රචනා කර ඇති අතර එය Historical Encounters Journal 2021 නොවැම්බර් සඟරාවෙහි පළ විය.

### ජුඩිත් පෙරේරා

ජුඩිත් 2015 වසරේ සිට ඉතිහාසය උගන්වයි. ජුඩිත්ට ඉතිහාසය පිළිබඳ ආචාර්ය උපාධියක් ඇත, එහිදී ඇයගේ නිබන්ධනය ලෙස අධ්‍යයනය කර ඇත්තේ සිරකරුවන්ගේ වාචික ඉතිහාසය පිළිබඳ ව ය. ජුඩිත්ගේ ද්විතියික විශේෂීකරණ ක්ෂේත්‍රය වන්නේ මහජන ඉතිහාසය යි. ඇය විශ්ව විද්‍යාලයේ සහ ද්විතීයික පාසල් මට්ටමින් වාචික ඉතිහාස හා සම්බන්ධ ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කර තිබේ.

# හැඳින්වීම

මෙම ඉගැන්වීමේ උපාය මාර්ගය සැකසීමට භාවිතා කලේ අපගේ පන්තිකාමර තුළ වාචික ඉතිහාස ක්‍රමවේද භාවිතා කිරීමෙන් අප ලත් අත්දැකීම්ය. වාචික ඉතිහාසය පන්ති කාමරය තුළ භාවිතා කිරීම හරහා අපගේ සිසුන් මහත් සේ ප්‍රතිලාභ ලබා ඇති අතර, එය ඉතිහාස විෂය මාලාව පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි දියුණු  කිරීමට  විශාල වශයෙන් දායක වී ඇත. වාචික ඉතිහාසය මගින් සිසුන්ගේ ජීවිතයට වැදගත් ජීවන කුසලතා උගන්වන අතර විවිධත්වයෙන් යුත් දෘෂ්ටිකෝණ සහ අදහස් ඇසුරින් ඉතිහාසය පිළිබඳ වඩාත් පුළුල් හා ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව ලැබේ. මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වීමෙන් අප බලාපොරොත්තු වන්නේ, වාචික ඉතිහාසය පන්ති කාමරයේදී භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ව මූලික හැඳින්වීමක් ලබා දෙමින් අපගේ අත්දැකීම් අනෙකුත් ඉතිහාස ගුරුවරුන් සමඟ බෙදා ගැනීමට ය.



# අන්තර්ගතය

**දළ විශ්ලේෂණය** ........ 04
උපායමාර්ගයේ අරමුණු ........ 04
වාචික ඉතිහාසය යනු කුමක්ද? ........ 04
විෂයමාලා සඳහා සබැඳි ........ 05
ඇතවිය හැකි බාධක ........ 06

**1. පන්ති කාමරය තුළ මෙම උපායමාර්ගය භාවිත කිරීම සඳහා මාර්ගෝපදේශය (පියවරෙන් පියවර)** ........ 08
ගුරුවරුන්ගේ සූදානම ........ 09
සම්පූර්ණ පන්තිය/කණ්ඩායම් සූදානම් කිරීම ........ 10
වාචික ඉතිහාසය ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සාකච්ඡා කිරීම ........ 10
වාචික ඉතිහාසය හා සම්බන්ධ ශ්‍රව්‍ය පටිගත කිරීම්, වීඩියෝ හෝ පිටපත් නිදර්ශක විශ්ලේෂණය කිරීම ........ 11
සිසුන් අතර ප්‍රායෝගික සම්මුඛ සාකච්ඡා කිරීම ........ 11
ගැඹුරින් සවන්දීමේ අභ්‍යාස ........ 12
සම්මුඛ සාකච්ඡා සිදුකිරීමේ දී මුහුණ දුන් දුෂ්කරතා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කිරීම ........ 14
සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වන්නන් තෝරා ගැනීම සහ කැමැත්ත ගැනීම ........ 16
සිසුන්ගේ පර්යේෂණාත්මක අධ්‍යයනය ........ 18
ප්‍රශ්න නිර්මාණය ........ 18
සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ........ 20
පිටපත් කිරීම ........ 21
සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වන්නන් සමග සමාලෝචනය ........ 22
විශ්ලේෂණය ........ 22
ඉදිරිපත් කිරීම ........ 25

**2. සියලු අදහස් ගැනීම කිරීම සඳහා උපාය මාර්ග** ........ 27
දුර්වල මට්ටමේ සිසුන්ට සහාය වීම ........ 28
විශේෂිත ඉගෙනුම් අවශ්‍යතා සහිත සිසුන්ට උපකාර කිරීම ........ 28
දක්ෂ සිසුන්ට උපකාර කිරීම ........ 29

**3. භාවිතා වන උපායමාර්ගය** ........ 30

**4. තෝරාගත් ග්‍රන්ථ නාමාවලිය** ........ 32

# දළ විශ්ලේෂණය

## 1. උපාය මාර්ගයේ අරමුණු

ඉතිහාසය, ශ්‍රී ලංකාවේ පාසල්වල ශාස්ත්‍රීය අධ්‍යයනයක් ලෙස පැවතියද එය සිසුන්ගේ එදිනෙදා ජීවිතයෙන් වෙන් ව පවතී. සිසුන්ට නිවසේ දී නොයෙකුත් ජන කතා, ජනප්‍රවාද, වාග් සම්ප්‍රදායන් සහ පවුලේ අතීත කතන්දර අදීය මුඛ පරම්පරාගතව සම්ප්‍රේෂණය වුවද, ඔවුන්ගේ පන්ති කාමරය තුළ දී වත්මන් ඉතිහාස විෂය මාලාව තුළ එවැනි මූලාශ්‍ර ඇතුළත් නොවේ. ඓතිහාසික පරිණාමය පිළිබඳ උගන්වන අර්ථකථන සහ සීමා සහිත විශ්ලේෂණ අරමුණු කරගත් ඓතිහාසික ආඛ්‍යාන, පරිකතා සහ ඔවුන් අසා ඇති කථා අතර විසංයෝජනයන් පවතී. අතීත වෘතාන්ත මඟින් කාලයත් සමඟ මිනිසුන් සහ ඔවුන්ගේ අදහස් හා සංස්කෘතීන්හි සිදුවුණු වෙනස්කම් පිළිබඳ සිසුන්ට වඩාත් ගැඹුරු අවබෝධයක් ලබා දෙයි.

පුරාණ රජවරුන් සහ ඔවුන්ගේ ජයග්‍රහණ හෝ යටත් විජිතකරණය සහ රාජ්‍ය නියෝජිතයන් වැනි මාතෘකා හා බැඳුණු කතන්දර ශ්‍රී ලංකා ඉතිහාසය අධ්‍යයනයේ දී උත්කර්ෂවත් අයුරින් පන්ති කාමරය තුළ උගන්වන අතර සාමාන්‍ය ජනයාගේ සමාජ දෘෂ්ටිකෝණයන් සහ ඔවුන්ගේ එදිනෙදා ජීවන අත්දැකීම් ඉස්මතු කෙරෙන, බොහෝ විට අධිපති ආඛ්‍යාන අභියෝගයට ලක් කරන ජන කථා පවතින්නේ ඓතිහාසික අධ්‍යයන විෂය පථයෙන් පිටය. මෙම විසංයෝජනය ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී සිසුන්ට ආගන්තුක බවක් දැනීමට හේතු වේ. මෙම උපායමාර්ගය මඟින් අරමුණු කරන්නේ සිසුන් තම පවුලේ හෝ ප්‍රජාවේ සාමාජිකයෙකු සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමෙන් වාචික ඉතිහාස ප්‍රවේශයක් ඇති කිරීම සහ එතුළින් ඉතිහාසය අධ්‍යයනය ඔවුන්ගේ ජීවිතය හා සම්බන්ධ කරමින් ඔවුන් ඉගෙනීමෙහි සක්‍රීය කිරීමටය.

## 2. වාචික ඉතිහාසය යනු කුමක්ද?

අපි අතීතය අධ්‍යයනය කරන විට ඇසිය යුතු වැදගත් ප්‍රශ්නයක් වන්නේ අප දන්නා දේ විශේෂයෙන්ම ඉතා ඈත කාලයේ සිදුවූ දේවල් ගැන, අප දැන ගත්තේ කෙසේද යන්නයි. මෙයට පිළිතුරු ලෙස ඉතිහාසය දැනගැනීමේ විවිධ ක්‍රම ලෙස සැලකිය හැකි ප්‍රාථමික මූලාශ්‍ර පරාසයක් අපට පරීක්ෂා කළ හැක. ප්‍රාථමික මූලාශ්‍ර වර්ග තුනකට බෙදිය හැකියඃ කතන්දර, පුරාවිද්‍යාව, සහ ලේඛන. එක් විශේෂිත කථා වර්ගයක් වන්නේ ජනශ්‍රුතියයි.

ජනශ්‍රැතිය යනු අතීත සිදුවීම් සහ ඒ සඳහා සහභාගිවූවන් පිළිබඳ ජනතාව අතර පවතින කථා සහ මතකයන් වන අතර ඒවා එක්රැස් කර, සංරක්ෂණය කර, නැවත ප්‍රකාශ කර, මුඛ පරම්පරාවෙන් /පරම්පරාවෙන් පරම්පරාවට වාචිකව සම්ප්‍රේෂණය වේ. පවුල් සම්ප්‍රදායන්, උත්සව සහ චාරිත්‍ර වාරිත්‍ර, පරිසරය පිළිබඳ දැනුම, ආගමික හා අධ්‍යාත්මික අත්දැකීම් දක්වා ජනශ්‍රැතීන් විහිදී යයි. ජනශ්‍රැතීන් වාචික ඉතිහාසයෙහි පූර්වගාමියා වේ. වාචික ඉතිහාසය යනු අධ්‍යයන ක්ෂේත්‍රයක් මෙන්ම අතීත සිදුවීම් පිළිබඳ පෞද්ගලික දැනුමක් ඇති අයගේ කතා සහ මතකයන් එකතු කර සංරක්ෂණය කිරීමේ ක්‍රමයකි. වාචික ඉතිහාසඥ ඩොනල්ඩ් රිචී මෙසේ පෙන්වා දේ, "මතකය යනු වාචික ඉතිහාසයේ හරය වන අතර, එයින් අර්ථය උකහා ගත හැකි අතර එය සංරක්ෂණය කළ හැක. සරලව කිවහොත්, වාචික ඉතිහාසය වාර්තාගත සම්මුඛ සාකච්ඡා හරහා ඓතිහාසික වැදගත්කමකින් යුත් මතකයන් සහ පුද්ගලික විවරණ රැස් කරයි. විධිමත් සම්මුඛ සාකච්ඡා වලදී මතකයන් පටිගත කිරීම වාචික ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයේ වැදගත් මූලාශ්‍රයකි.

වාචික ඉතිහාසය සඳහා විවිධ ප්‍රවේශයන් රාශියක් ඇත. ඇතැම් වාචික ඉතිහාස ජීවිත කතා ප්‍රවේශයක් ගනී, සම්මුඛ පරීක්ෂණයේ දී ආරාධිතයන්ගේ ජීවිත කතාව මුල සිට මේ දක්වා ආවර්ජනය කරන ලෙස ඉල්ලා සිටියි. තවත් ප්‍රවේශයක් ලෙස වාචික ඉතිහාසවලට විශේෂිත සිදුවීම්, කාල පරිච්ඡේද හෝ මතකයන් ගවේෂණය කිරීම ඇතුළත් විය හැකිය. මෙම අවස්ථා වලදී, ඔවුන්ගේ ජීවිතයේ යම් කාල පරිච්ඡේදයක් හෝ ස්ථානයක් පිළිබඳ ඔවුන්ට මතක ඇති දේ ගැන මෙනෙහි කිරීමට සම්මුඛ පරීක්ෂණ කරන්නන් ඉල්ලා සිටිය හැක. විවිධ පුද්ගලයන් හෝ රාජ්‍ය ආයතන විසින් සිදු කර තිබෙන අසාධාරණයන් සහ අපරාධ පිළිබඳව සාක්ෂි ද වාචික ඉතිහාසයට අතුළත් විය හැක. එබැවින් අධ්‍යාපනඥයින් විසින් වාචික ඉතිහාසයෙහි අසංඛ්‍යාත හැකියාවන් මතක තබා ගත යුතුය.

## 3. විෂයමාලා සඳහා සබැඳි

සෑම වාචික ඉතිහාස සම්මුඛ සාකච්ඡාවක්ම වෙනස් වේ. සම්මුඛ පරීක්ෂණය කෙසේ සිදුවේ ද හෝ කුමන තොරතුරු හෙළිදරව්වේ ද යන්න පිළිබඳ ව අනාවැකි කීම අපහසුය. එමනිසා පෙර සූදානම වාචික ඉතිහාසයේ වැදගත් අංගයකි. මෙම සංකීර්ණත්වය සහ අනාවැකි කීමේ දුෂ්කරතාවය හේතුවෙන්, වාචික ඉතිහාස ක්‍රමවේද අනුගමනය කිරීම සහ ප්‍රගුණ කිරීම මගින් ඉතිහාස විෂය මාලාවකින් ලැබෙන දැනුම ප්‍රමාණයට වඩා වැදගත් ජීවන කුසලතා සිසුන්ට උගන්වයි. වාචික ඉතිහාසය මගින් සිසුන්ට පර්යේෂණ අධ්‍යයනය සඳහා මූලාශ්‍ර සෙවීම, විශ්ලේෂණය සහ විචාරාත්මක ඇගයීම වැනි විද්වත් කුසලතා ඉගෙනගත හැකිය. වාචික ඉතිහාසය අධ්‍යයනයේ දී සිසුන් ගැඹුරින් සවන්දීමට, දුෂ්කර සංවාදවල යෙදීමට සහ දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දීමට පුරුදු කෙරෙන නිසා ඔවුන් තුළ කරුණිකබව සහ සහකම්පනය වැනි වෙනත් කුසලතාද ඇති වේ. එවැනි කුසලතා සාමාන්‍යයෙන් විභාග සමත් වීමේ අරමුණ සඳහා අවධාරණය කරන කටපාඩම් ඉගෙනීමෙන් ඔබ්බට යයි.

ගුරුවරුන්ට ඔවුන්ගේ පන්ති කාමරයට වාචික ඉතිහාසය ඇතුළත් කර ගැනීමට විෂයමාලා සබැඳි විශේෂිත අවස්ථාවන් සපයයි. ශ්‍රී ලංකාවේ දේශීය විෂයමාලා තුළ අවම වශයෙන් ප්‍රධාන අධ්‍යයන ඒකක දෙකක් තිබේ. පළමුව, 6 වසර සිසුන් ඉතිහාසය අධ්‍යයනයට හඳුන්වා දී ඔවුන්ගේ අධ්‍යයනය ආරම්භ කරන්නේ Unit 1: Defining History යන ඒකකයෙනි. මෙම ඒකකය තුළ, 1.2 කොටස ඉතිහාසය අධ්‍යයනය කරන්නේ කෙසේද යන මාතෘකාව අප ඉහත සාකච්ඡා කළ ප්‍රාථමික මූලාශ්‍ර වර්ග තුන ඇසුරින් අතීතය දැනගැනීමේ විවිධ ක්‍රම පිළිබඳව සිසුන්ට හඳුන්වා දීමට කදිම අවස්ථාවක් බව පෙනේ. මෙහිදී වැඩිහිටියන් සමග කතා කිරීමට සිසුන් උනන්දු කරවීමේ වාචික සම්ප්‍රදායන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ හැකිය. එමගින් නිවසේ හෝ පුළුල් ප්‍රජාව තුළ පවතින විශේෂිත පවුලක් හෝ සංස්කෘතික සම්ප්‍රදායක් පිළිබඳ අධ්‍යයනය කිරීම විධිමත් වාචික ඉතිහාස ක්ෂේත්‍රය සඳහා දොරටු විවර කරයි.

මීට අමතරව, 10 වසර සිසුන් ඉතිහාසය අධ්‍යයනය ආරම්භ කරව පළමු වන ඒකකය වන්නේ: "ඉතිහාසය අධ්‍යයනය කිරීමේ මූලාශ්‍ර" යන්නයි. මෙම ඒකකය තුළ, 1.1 මූලාශ්‍ර වර්ගීකරණය යන මාතෘකාව යටතේ ප්‍රධාන වශයෙන් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක ලෙසින් මූලාශ්‍ර වර්ගීකරණය කිරීමට උත්සාහ කරයි. මෙහිදී, ඉතිහාසය හැදෑරීමේදී සලකා බැලිය යුතු තුන්වන වැදගත් ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස වාචික ඉතිහාසය (සහ වාචික සම්ප්‍රදායන්) ඇතුළත් කිරීමට අවස්ථාවක් පවතී.

# 4. ඇතිවිය හැකි බාධක

### ප්‍රමාණාත්මක කාලය

පන්ති කාමරය තුළ එවැනි උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා කාලය මූලික බාධාවක් විය හැකිය. දැනටත් සීමා සහිත වාර කාලසටහනක් තුළ විෂයමාලා ආවරණය කිරීමේ දී ගුරුවරුන් බොහෝ විට පීඩනයට ලක් වේ. එමනිසා, එවැනි උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා වසරක් තුළ ලැබෙන කාලය ප්‍රමාණවත් කාලයක් නොවිය හැකිය. මේ සඳහා විසඳුම් දෙකක් ඉදිරිපත් කළ හැකිය. පළමුව, උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු විෂය බාහිර ක්‍රියාකාරකම් හෝ සමාජයක් නිර්මාණය කිරීම පිළිබඳ ව ගුරුවරුන්ට සිතිය හැකිය. ඉතිහාස සමාජයක් වැනි එවැනි සමාජ දැනටමත් පාසල්වල පැවතිය හැකි අතර ඒ හරහා නිර්මාණාත්මක විෂය බාහිර ක්‍රියාකාරකම් දියත් කර හැක. දෙවනුව, උනන්දුවක් දක්වන ගුරුවරුන් 6 වසර සිට 9 වසර දක්වා විභාග කේන්ද්‍රීය නොවන වසර කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කර මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව සිතිය හැක.

## සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වන්නන් තෝරා ගැනීම

සුදුසු සම්පත් දායකයෙකු සොයා ගැනීමේ දුෂ්කරතාවය පන්ති කාමරය තුළ එවැනි උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා මතුවිය හැකි තවත් විභව බාධාවක් විය හැකිය. ඇතැම් විට එවැනි වාචික ඉතිහාස සම්මුඛ පරීක්ෂණ ව්‍යාපෘතිවලට පුද්ගල කැමැත්ත ලබා ගැනීමේ අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවිය හැකි අතර ඇතැම් විට අපේක්ෂිත සම්පත් දායකයා තෝරාගත් මාතෘකාව පිළිබඳ ඵලදායී ලෙස අදහස් ප්‍රකාශ කිරීමට අපොහොසත් විය හැක. සමීප පවුලේ සාමාජිකයන් අතර සුදුසු සම්පත්දායකයෙකු සොයා ගැනීමේ දුෂ්කරතාවයට විසඳුමක් ලෙස  විෂය පිළිබඳ අවබෝදයක් ඇති අසල්වාසීන් හෝ මිතුරු සම්බන්ධතා දක්වා තෝරාගැනීම පුළුල් කළ හැක. මේ සඳහා තම පාසලේ ගුරුවරුන් පවා තෝරාගත හැක.

## විචාරාත්මක ඇසකින් බැලීම

පන්ති කාමරය තුළ එවැනි උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමට ඇති තුන්වන විභව බාධකයක් විය හැක්කේ, සම්මුඛ පරීක්ෂණ සහ මූලාශ්‍ර විචාරාත්මකව ඇගයීමට සිසුන් දක්වන මැලිකම හෝ නොහැකියාවයි. මේ සඳහා විසඳුම් ලෙස පළමුව ගුරුවරුන් විසින් විවිධ වර්ගයේ මූලාශ්‍ර අතර සම්බන්ධතා පරීක්ෂා කර පර්යේෂණ සහ ලේඛන හරහා ඔවුන් සොයාගත් තොරතුරු පිළිබඳව විචාරාත්මකව  සිතීමට යොමුවිය යුතුය. මේ සඳහා ගුරුවරුන්ට විචාරාත්මක විශ්ලේෂණය සඳහා සම්මුඛ සාකච්ඡා සහ මූලාශ්‍රවලට අදාළ මාර්ගෝපදේශ ප්‍රශ්න භාවිතා කළ හැකිය. දෙවනුව එම මූලාශ්‍ර සිසුන්ට ඉදිරිපත් කරමින් සිසුන් සමඟ ඒවා සාකච්ඡා කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදුකල හැකිය.

## සංකීර්ණ සංකල්ප සහ පාරිභාෂිතය භාෂා භාවිතය

වාචික ඉතිහාසය සමඟ සම්බන්ධ වන සිසුන්ට මතු විය හැකි තවත් අභියෝගයක් වන්නේ සාමාන්‍යයෙන් ඉතිහාස පාඩම් වලදී සම්බන්ධ නොවන සංකීර්ණ සංකල්ප සහ පාරිභාෂිතයන් මුණගැසීමයි. ඉතිහාසය අධ්‍යයනයේ දී බොහෝ සංකල්ප සහ ඇතැම් වචන සිසුන්ට අභියෝගාත්මක විය හැකිය. පහත ක්‍රියාකාරකම් සිසුන්ට මෙම පිළිබඳව හුරුවක් ලබා ගැනීමට උපකාරී විය හැක. ක්‍රියාවලිය පුරාම සිසුන්ගේ මට්ටමට යෝග්‍යවන පරිදි මුඛ්‍ය පදවල අරුත් සම්පාදනය සඳහා පාරිභාෂික ශබ්දකෝෂයක් සැපයීම ප්‍රයෝජනවත් විය හැකිය.

# I.



## පන්ති කාමරය තුළ මෙම උපාය මාර්ගය භාවිතා කිරීම සඳහා මාර්ගෝපදේශය (පියවරෙන් පියවර)

# 1. ගුරුවරයා සූදානම් කිරීම

වාචික ඉතිහාසයේ ස්වභාවය පිළිබඳව යම් කියවීමක් කිරීම ගුරුවරුන්ට උපකාරී වේ. මෙවැනි පසුබිම් කියවීම් සඳහා පහත වෙබ් අඩවි මූලාශ්‍රය කරගත හැක. එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදයේ වාචික ඉතිහාස සංගමය (https://www.ohs.org.uk) ගුරුවරුන්ට ඓතිහාසික සංවාද හෙවත් පෝඩ්කාස්ට්වලටද සවන් දිය හැක (https://www.oralhistory.org). එහිදී ශ්‍රී ලංකාවේ වාචික ඉතිහාසඥයින් ඔවුන්ගේ කාර්යයේ විවිධ පැතිකඩයන් සාකච්ඡා කරන අතර වාචික ඉතිහාසය පිළිබඳ උදාහරණ භාෂාව හුරු කර ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. (https://historicaldialogue.lk/podcast/ep-1). සිසුන්ගේ රුචිකත්වය වර්ධනය සඳහා වාචික ඉතිහාස සම්මුඛ සාකච්ඡා වල විවිධ පැති වීඩියෝ පටිගත කිරීම්, ශ්‍රව්‍ය පටිගත කිරීම් සහ/හෝ පිටපත් ආකෘතින් මාර්ගගත සෙවුමක් හරහා සොයාගත හැකිය.

- ශ්‍රී ලාංකේය වැඩිහිටියන්ගේ හඬ සහ රූප: http://iam.lk/
- HerStories (මව්වරුන් කෙරෙහි අවධානය යොමු කරමින් සිදුකළ සම්මුඛ සාකච්ඡා): http://theherstoryarchive.org/
- පොදුරාජ්‍ය මණ්ඩලීය වාචික ඉතිහාස ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා අංශය): https://commonwealthoralhistories.org/sri-lanka/
- යුනෙස්කෝ ලෝක උරුම පුරෝගාමීන්: http://www.slncu.lk/web/index.php?option=com_content&view=article&id=81:an-oralhistory-interviews-with-the-pioneers-of-the-world-heritage convention&catid=8&lang= en&Itemid=14

### උපකරණ සහ සම්පත්

ගුරුවරුන් සිසුන්ට අවශ්‍ය උපකරණ සහ සම්පත් මොනවාදැයි සලකා බැලිය යුතුය. පළමුව, සිසුන්ට සම්මුඛ පරීක්ෂණයේ සම්පූර්ණ කාලසීමාව සඳහා පටිගත කළ හැකි පටිගත කිරීමේ උපකරණ අවශ්‍ය වේ.

සම්මුඛ පරීක්ෂණ දිගින් වෙනස් විය හැකි අතර පැය කිහිපයක් පැවතිය හැකි බව සිසුන් තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. අනපේක්ෂිත හෝ නොවළැක්විය අවස්ථාවක හැර සම්මුඛ පරීක්ෂණ නවතා නැවත ආරම්භ නොකළ යුතුය. පරිගණකයක්, දුරකථනයක්, වීඩියෝ හැකියාවක් සහිත කැමරාවක්, ඩික්ටාෆෝනයක් හෝ යනාදී අවශ්‍ය උපකරණ පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය.. බාහිර මයික්‍රොෆෝනයක් බොහෝ විට නිර්දේශ කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට පෙර සිසුන් භාවිත කරන උපාංග සම්පූර්ණයෙන්ම ආරෝපණය වී ඇති ද යන්න සහ මතක ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩක් තිබේදැයි පරීක්ෂා කිරීම වැදගත්

වේ. ගැටළු වළක්වා ගැනීම සඳහා සිසුන් පටිගත කිරීමේ උපකරණ දෙකක් භාවිතා කිරීම නිර්දේශ කෙරේ. දෙවනුව, සම්මුඛ පරීක්ෂණය පිටපත් ගබඩා කිරීමට සරල පරිගණකයක් හෝ ටැබ්ලට් පරිගණකයක් ප්‍රමාණවත් වේ.

# 2. සම්පූර්ණ පංතිය/කණ්ඩායම් වෙන් කිරීම්

සිසුන් තමන්ගේම වාචික ඉතිහාස අධ්‍යයනය කිරීමට සූදානම් වීමට පෙර, මූලික කුසලතා සහ අවබෝධය තහවුරු කර ගැනීම සඳහා මුළු සිසු පිරිස හෝ කණ්ඩායම් කිරීම වැදගත් වේ. ඔබ ඔබේ පන්තිය සමඟ කිරීමට සූදානම් වන ක්‍රියාකාරකම්වල අනුව  සිසුන් කාණ්ඩ කළ හැක.

## a) වාචික ඉතිහාසය ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සාකච්ඡා කිරීම

වාචික ඉතිහාසවල ස්වභාවය සහ ඓතිහාසික මූලාශ්‍ර ලෙස ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. පහත ප්‍රශ්න ඇසුරින් සාකච්ඡාවට මඟ පෙන්විය හැකිය.

- **වෙනත් ආකාරයේ ඓතිහාසික මූලාශ්‍රවලට වඩා වාචික ඉතිහාස මූලාශ්‍ර වෙනස් වන්නේ කෙසේද?**

  පිළිතුර -

  - අපට කතා කරන පුද්ගලයා දැකීමට සහ ඇසීමට හැකි බව

  - මේවා සඳහා නිශ්චිත අතීත සාධක නොවන අතර වාචික ඉතිහාසඥයා සහ සම්මුඛ පරීක්ෂක විසින් නිර්මාණය කරන ලද මූලාශ්‍රක් බව

  - ඒවා අතීතය සහ වර්තමානය අතර කොතැනක හෝ පිහිටා තිබීම. මේ අනුව ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර තත්ත්වය අතර පැවතීම.

  - වාචික ඉතිහාසය පෙර ඓතිහාසික අධ්‍යයනයේ හිඩැස් පුරවා ඇති අතර එහි මතකය සහ ඉතිහාසය හැඩගැස්වීම සඳහා නව දැනුම සඳහා දායකත්වය ලබා දේ.

- **වෙනත් මූලාශ්‍රවලින් අපට ඉගෙන ගැනීමට නොහැකි වාචික ඉතිහාසයෙන් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද?**

  මෙම ප්‍රශ්නය සඳහා, ඔබට මෙවැනි අදහස් වෙත සිසුන්ගේ අවධානය යොමු කළ හැකිය:

  - වෙනත් ඓතිහාසික මූලාශ්‍ර විසින් නොසලකා හරින ලද පුද්ගලයන් සහ කණ්ඩායම් නියෝජනය කිරීම. මූලාශ්‍ර (උදා. සුළු ජාතීන්, නූගත් හෝ සාක්ෂරතාව නැති ජනතාව, සාමාන්‍ය මිනිසුන්)

  - පුද්ගල අත්දැකීම් සහ මතකයන් මත වාචික ඉතිහාසයේ අවධානය යොමු කිරීම.

  - වාචික ඉතිහාසඥාගෙන් අනාවරණය කර ගැනීමට ඉලක්ක කරගත් සහ නිශ්චිත ප්‍රශ්න ඇසීමට ඇති හැකියාව

  - වෙනත් තැන්වලින් සොයාගත නොහැකි විස්තර දැනගැනීම.

- **වාචික ඉතිහාස මූලාශ්‍ර ලෙස භාවිත කිරීමේ සමහර සීමාවන් මොනවාද?**
  - මතකය හා සම්බන්ධ ගැටළු
  - සම්මුඛ පරීක්ෂණයේදී ආත්මීයත්වය සහ ඉදිරිදර්ශනයේ භූමිකාව
  - ප්‍රතිඵලය මත සම්මුඛ පරීක්ෂකගේ බලපෑම
  - වාචික ඉතිහාස මූලාශ්‍ර වෙනත් බොහෝ සීමාවන්ට මුහුණ දෙන ආකාරය

  ඓතිහාසික මූලාශ්‍ර (පක්ෂග්‍රාහීත්වය, තේරීම, නිරවද්‍යතාවයේ දෝෂ ආදිය)

## b) ආදර්ශ වාචික ඉතිහාස ශ්‍රව්‍ය පටිගත කිරීම, වීඩියෝ හෝ පිටපතක් විශ්ලේෂණය සඳහා සූදානම් කිරීම

මෙම අදියරේදී තෝරාගත් උදාහරණ එකක් හෝ කිහිපයක් භාවිත කරමින්, වාචික ඉතිහාසයක විවිධ පැති විශ්ලේෂණය කිරීමට සිසුන්ට මග පෙන්වයි. ඔබට මෙම ක්‍රියාකාරකම සම්පූර්ණ පන්තියක් ලෙස, කුඩා කණ්ඩායම් වශයෙන් හෝ සිසුන් තනි තනිව කාර්යයකට පැවරීමෙන් සම්පූර්ණ කිරීමට තෝරා ගත හැක.

- සම්මුඛ පරීක්ෂකවරයා සාක්ෂිය කෙරෙහි ඇති කරන බලපෑම කුමක්ද?
  - ඔවුන් ඕනෑවට වඩා කතා කරනවාද? ප්‍රමාණවත් මදිද?
  - ඔවුන් අසන ප්‍රශ්න මොනවාද?
- කථකයාගෙන් සහ ඔහුගේ අද්දැකීම්වලින් සහ ඔවුන්ගේ පෙනුමෙන් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද? (හඬ, අභිනයන්, මුහුණේ ඉරියව්, ආදිය)?
- මෙම වාචික ඉතිහාසයෙන් අපට අතීතය ගැන ඉගෙනගත හැක්කේ කුමක්ද?
- සාක්ෂිය කොතරම් නිවැරදිද? අපට මෙය සත්‍යාපනය කළ හැක්කේ කෙසේද?
- අතීතය මතක තබාගැනීම පිළිබඳව ඉගෙනගත හැක්කේ මොනවාද?

අසාර්ථක සම්මුඛ සාකච්ඡා සඳහා උදාහරණ කිහිපයක් සොයා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැකිය. එමගින් වැරදි අවම කරගත හැකි අතර එය ඵලදායි සහ ආකර්ෂමත් සම්මුඛ සාකච්ඡා අතර පවතින වෙනස්කම් පැහැදිලි කිරීමට උපකාරී වේ.

## c) සිසුන් අතර සම්මුඛ පරීක්ෂණ කිරීමට පුහුණුවීම

සිසුන් විසින් පවත්වනු ලබන වාචික ඉතිහාස සම්මුඛ පරීක්ෂණය අතීතය පිළිබඳව යමෙකු සමග සම්මුඛ සාකච්ඡා කිරීමේ පළමු අත්දැකීම ලෙසින් වැදගත් වේ. ගුරුවරුන් විසින් සිසුන්ට සම්මුඛ සාකච්ඡාවකදී කළ යුතු සහ නොකළ යුතු දේ ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට අවස්ථාව ලබා දිය යුතුය. යමෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමේදී, වැදගත් වන කරුණු ලැයිස්තුගත කිරීම අවශ්‍ය වේ.

සම්මුඛ පරීක්ෂක භූමිකාවේ දැක ඇති වැරදි රඟ දැක්වීමට සිසුන්ගෙන් ඉල්ලා සිටිය හැකිය.

- එක් සිසුවෙකු සම්මුඛ පරීක්ෂකවරයා ලෙසත් අනෙක් ශිෂ්‍යයා සම්පත් දායකයා ලෙසත් ක්‍රියා කිරීමට සලස්වන්න.
- සම්මුඛ පරීක්ෂණය සඳහා මාතෘකාවක් තෝරාගන්න.
- සිසුන් අතින් සිදුවිය හැකි වැරදි ලියා ඇති කාඩ්පතක් දී ඔවුන්ට සිතීමට කාලය දෙන්න. (උදාහරණයක් ලෙසඃ ඕනෑවට වඩා කතා කිරීම, එකම ප්‍රශ්නය නැවත නැවත ඇසීම, ප්‍රශ්න කිහිපයක් ඇසීම).
- සම්මුඛ පරීක්ෂණයේදී ශිෂ්‍යයාට භූමිකාව රඟපෑමේදී හිතාමතාම වැරැද්ද කරන්න යැයි උපදෙස් දන්න.
- පසුව අන් සිසුන්ට වැරැද්ද කුමක්දැයි හඳුනා ගැනීමට ඉඩ දී ඒ පිළිබඳ සාකච්ඡා කරන්නඃ

මෙය ගැටලුවක් වූයේ ඇයි? එය කුමන බලපෑමක් ඇති කළේද?
අපට මෙය වළක්වා ගත හැක්කේ කෙසේද?

සිසුන් එකිනෙකා අතර සම්මුඛ සාකච්ඡා කිරීමට සහ අවධානයෙන් සවන් දීමට යොමු කරවා සම වයසේ මිතුරන්ගෙන් ප්‍රතිපෝෂණ ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. මෙහිදී

- යුගල වශයෙන්, සිසුන් ඔවුන්ගේ සම්මුඛ සාකච්ඡා සඳහා මාතෘකාවක් සඳහා එකඟ වේ.
- A- ශිෂ්‍ය සම්මුඛ පරීක්ෂක B - ශිෂ්‍ය සම්පත් දායක
- A ශිෂ්‍යයා ප්‍රශ්න කරන අතර B ශිෂ්‍යයා නිර්මාණාත්මක ප්‍රතිපෝෂණ ලබා දීම සිදු කරයි.
- සිසුන්ගේ භූමිකා මාරු කර ක්‍රියාවලිය නැවත කරන්න.
- සාකච්ඡා කරන්නඃ
  - අපි හොඳින් කළේ කුමක්ද?
  - අපි වර්ධනය කරගැනීමට අවශ්‍ය කුමක්ද?
  - අභියෝගාත්මක වූයේ කුමක්ද?
  - අපට දියුණු විය හැක්කේ කෙසේද?

## d) ගැඹුරින් සවන්දීමේ අභ්‍යාස

සිසුන්ට සම්මුඛ සාකච්ඡා කිරීමේ පුහුණුව ලබා දෙන අතර සවන් දීම පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුය. නිශ්චිත මාතෘකාවක් පිළිබඳ ප්‍රශ්න ලැයිස්තුවක් සකසා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. සිසුන් සම්මුඛ පරීක්ෂකවරුන් වී ගුරුවරයා සම්පත් දායකයාගේ භූමිකාව ඉටු කරන්න. මෙහිදී ශිෂ්‍යයෙකු විසින් අසන සෑම ප්‍රශ්නයකටම ගුරුවරයා වාචික නොවන අවාචික ප්‍රතිචාරයක් පෙන්විය යුතුය.

උදාහරණයක් ලෙස,ශිෂ්‍යයෙකු විසින් සම්පත් දායකයාගෙන් ජීවිතයේ විශේෂිත සිදුවීමක් සහ ඔවුන්ට මතකයේ ඇති හැඟීම පිළිබඳ අසන විට ගුරුවරයාට ප්‍රතිචාර දැක්විය හැක්කේ "එය ඉතා ප්‍රීතිමත් දවසක්" යැයි  දෑස් මඟින් පනේවා සෙමෙන් පැවසීමේනි. පසුව ගුරුවරයා විරාමයක් තබා සිසුන් එය හඳුනාගත්තා දැයි බැලිය යුතුය. ගුරුවරයා පවසන්නේ කුමක්ද යන්න සිසුන් විසින් නිගමනය කළ යුතුය.

"ගැඹුරු සවන්දීම" යන්නෙන් අදහස් කරන්නේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන්නා පවසන දෙය සහ ඔවුන් එය පවසන ආකාරය සිසුන්ට දැනීමට සහ තේරුම් ගැනීමට ඇති හැකියාවයි. බොහෝ විට අපගේ එදිනෙදා සංවාදවලදී, මිනිසුන් පවසන දෙයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් එමගින් කියවිය හැක. මෙය පුහුණු කිරීමෙන් සිසුන්ට ජීවන කුසලතා පරාසයක් ද වර්ධනය කර ගැනීමට හැකි Autism Spectrum Disorders (ASD) වැනි තත්ත්ව සහිත ඇතැම් සිසුන්ට මෙම ක්‍රියාකාරකමට සම්බන්ධ වීමට හෝ ඒවාට ප්‍රතිචාර දැක්වීමට නොහැකි විය හැකි බව ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු අතර, එම සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප අභ්‍යාස ඇති කිරීමට වග බලා ගත යුතුය.

## නිදසුන් 1

ශිෂ්‍ය 1 (සම්මුඛ පරීක්ෂක): ප්‍රවෘත්තිය ඇසූ විට ඔබට හැඟුණේ කෙසේද?

ගුරුවරයා (සම්පත් දායකයා): (අමනාප ස්වරයෙන්) එදා හරිම සතුටු දවසක්.

ගුරුවරයා නිහඬ වී අහක බලා ගනී.

ශිෂ්‍ය 2 (සම්මුඛ පරීක්ෂක): ඔබ සතුටින් සිටින බවක් පෙනෙන්නේ නෑ. එම දිනය ගැන තවදුරටත් සාකච්ඡා කිරීමට ඔබ කැමතිද?

ගුරුවරයා : හොඳයි, මම හිතන්නේ එය මෙම සම්මුඛ පරීක්ෂණයට අදාළ නැහැ.

ශිෂ්‍ය 2 (සම්මුඛ පරීක්ෂක): ඔබට ඒ පිළිබඳව කථා කිරීමට අවශ්‍ය නම්, මම සවන් දීමට කැමතියි. එසේ නොවේ නම්, අපට හැකිය මීළඟ ප්‍රශ්නයට යන්න.

ගුරුවරයා : හොඳයි, එය මට අමුතු දවසක් නිසා ...

කෙසේ වෙතත්, ඇතැම් සහභාගී වන්නන් සාකච්ඡා කිරීමට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි නම් ඊළඟ ප්‍රශ්නයට යා යුතුය.

## නිදසුන් 2

ශිෂ්‍ය 1 -  (සම්මුඛ පරීක්ෂක): ප්‍රවෘත්තිය ඇසූ විට ඔබට හැඟුණේ කෙසේද?

ගුරුවරයා (සම්පත් දායකයා): (අමනාප ස්වරයෙන්) එදා හරිම සතුටු දවසක්.

ගුරුවරයා නිහඬ වී අහක බලා ගනී.

ශිෂ්‍ය 2 (සම්මුඛ පරීක්ෂක): ඔබ සතුටින් සිටින බවක් පෙනෙන්නේ නෑ. එම දිනය ගැන තවදුරටත් සාකච්ඡා කිරීමට ඔබ කැමතිද?

ගුරුවරයා : නැහැ, මම ඒ ගැන කතා කරන්න කැමති නැහැ.

ශිෂ්‍ය 2 (සම්මුඛ පරීක්ෂක): එහෙනම් අපි ඊළඟ ප්‍රශ්නයට යමු. ඔබ හොඳින්ද?

සම්මුඛ පරීක්ෂණය දිගටම කරගෙන යන්නද?

ගුරුවරයා : ඔව්, අපි ඊළඟ ප්‍රශ්නයට යමු

## e) සම්මුඛ සාකච්ඡා වලදී සිසුන්ට මුහුණ දීමට සිදුවන අසීරු අවස්ථා පිළිබඳව සාකච්ඡා කරන්න (උදා. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන්නන් සංවේදී වීම)

එක් එක් සම්මුඛ සාකච්ඡා එකිනෙකට වෙනස් බව හඳුනා ගැනීම වැදගත්ය. සම්මුඛ පරීක්ෂණ කුමන ආකාරයක් ගනීදැයි අනාවැකි කීම දුෂ්කර ය. එබැවින් සම්මුඛ පරීක්ෂණ වලදී දුෂ්කරතා මතු වීම බලාපොරොත්තු වීමට සහ ඒ සඳහා සිසුන් සූදානම් කිරීමට ගුරුවරුන්ට යම් යම් ක්‍රියාමාර්ග ගත හැකිය.

පළමුව, ගුරුවරුන් සාකච්ඡා මෙහෙයවීමේ දී සිසුන් විසින් සකසන ප්‍රශ්න ලැයිස්තු එකිනෙකා අතර බෙදා හරියි. ප්‍රශ්න ලැයිස්තු තුළ සම්මුඛ සාකච්ඡා වල පිළිතුරු දීමට අපහසු යැයි සිතන ප්‍රශ්න ඇතිනම් හෝ එම ප්‍රශ්න සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නන් සංවේදී කරවීමට හේතු විය හැකි යයි සිතනවානම් ඒවා හඳුනා ගනී. සිසුන් සුදුසු මාතෘකා තෝරා ගැනීමට වග බලා ගැනීම සහ ඔවුන්ගේ ප්‍රශ්න ලැයිස්තුව සංවේදී ප්‍රශ්න වලින් ආරම්භ නොවන බවට ගුරුවරයා පරීක්ෂා කළ යුතුය. මෙම ගැටලුව මතු කිරීමට සහ සම්මුඛ සාකච්ඡාකදී ඔවුන් මුහුණ දිය හැකි සංවේදී අවස්ථා පිළිබඳව සිසුන් දැනුවත් කිරීමට මෙය ඉතා වැදගත් පියවරක් විය හැකිය. හැඟීම්බර ප්‍රතිචාරයක් ලැබිය හැකි මාතෘකා පිළිබඳව සිසුන්ද කතා බහ කර අවබෝධ කර ගත යුතුය. (උදා: පවුලේ සාමාජිකයෙකුගේ මරණය). තවද ගුරුවරයාට සිසුන් මුහුණ දුන් අපහසු අවස්ථා ගැන විස්තර සටහන් කරගෙන ඊළඟ වසරේ සිසුන් සමඟ බෙදා ගත හැක. සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නන් සංවේදී කරවීමට හේතු විය හැකි මාතෘකා සිසුන් හඳුනා ගන්නේ කෙසේද යන්නද සාකච්ඡා කල හැක. උදාහරණ ලෙස කුමන වචන, කුමන වගන්ති, මුහුණ වෙනස් වන ආකාරය, සහ ඉරියව් මගින් සම්මුඛ සාකච්ඡාවේ සංවේදී ස්ථානයකට පැමිණ ඇති බව පෙන්නුම් කරයිද යන්න සහ එම අවස්ථාවල පරිස්සමෙන් හැසිරිය යුතු බව අවබෝධ කර ගැනීම.

දෙවනුව ශිෂ්‍යයෙකුට තනිව සම්මුඛ සාකච්ඡාවක් මෙහෙය වීමට අපහසු නම් ගුරුවරුන්ට සිසුන් යුගල වශයෙන් ඒ සඳහා ඉදිරිපත් කල හැකි අතර එසේ ඉදිරිපත් කිරීම මගින් ඔවුන්ගේ ආත්ම විශ්වාසය ගොඩනැගීම මෙන්ම ඔවුන් අතර කණ්ඩායම් වැඩ වර්ධනය කල හැක. යුගල වශයෙන් කණ්ඩායම් කල සිසුන්ට පන්ති කාමරය තුල සාකච්ඡා කිරීමේ දී ඔවුන්ගේ අත්දැකීම් අනෙකුත් සිසුන් සමග බෙදා ගැනීමට පිළිවන.

තෙවනුව, ඕනෑම මොහොතක සම්මුඛ සාකච්ඡාවක් නැවැත්වීමට සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නන්ට අභිමතය ඇති බව ගුරුවරුන් සිසුන්ට අවබෝධ කර දිය යුතුය. මෙහි දී ප්‍රමුඛතාවය වන්නේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම නොව සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නා සමඟ ගෞරවනීය සහ සියළු පාර්ශව ඇතුළත් වන සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම බව සිසුන්ට අවධාරණය කළ යුතුය. මෙලෙස ගොඩනගා ගන්නා සබඳතාවයෙන් අදහස් වන්නේ සම්මුඛ සාකච්ඡාවක් ඕනෑම මොහොතක නතර කිරීමට සහ/හෝ ඔවුන් අසන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමට සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නන්ට සැමවිටම අභිමතය ඇති බවයි. මෙහිදී ගුරුවරුන් සිදු කල යුත්තේ පාසල් ව්‍යාපෘතියක් නිම කරනවාට වඩා ව්‍යාපෘතියේ ඉල්ලකය වන සබඳතා ගොඩනගා ගැනීම සහ සන්නිවේදන මාර්ග විවෘත කිරීම යන්න ඉස්මතු කිරීමයි.

හතරවනුව, සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නෙකු චිත්තවේගී වූ නමුත් සම්මුඛ සාකච්ඡාව දිගටම කරගෙන යාමට කැමති නම් කුමක් කළ යුතුද යන්න ගුරුවරුන්ට පුහුණු කර විය හැක. ඒ අනුව චිත්තවේගීය තත්වයට පත් වූ කෙනෙකුව සැනසිය හැකි විවිධ ක්‍රම සිසුන් සමග සාකච්ඡා කළ හැකි අතර (උදා., උරහිස මත අත තැබීම, වැළඳ ගැනීම, නිහඬව බලා සිටීම, "මෙය ඔබට අපහසු බව මට පෙනේ..." වැනි ඔවුන්ව ධෛර්යමත් කරන ප්‍රකාශයන්) සංස්කෘතික සම්මතයන් සහ සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නා සමඟ ඇති සබඳතාව අනුව මින් කවරක් යෝග්‍ය දැයි සලකා බැලීමට පිළිවන. මෙම පෙර සූදානමේ කොටසක් ලෙස මේ ක්‍රම පෙන්වන පන්ති සාකච්ඡා පැවැත්විය හැකි අතර කලින් වාර්තා කරන ලද සම්මුඛ සාකච්ඡා වලදී අපහසුතාවයට පත් වූ අවස්ථා පිළිබඳ උදාහරණ පෙන්විය හැක. සමහර විට දුෂ්කර මොහොතක හොඳම ක්‍රියාමාර්ගය වනුයේ නිශ්ශබ්දව සිටීම සහ සම්මුඛ සාකච්ඡාවට මුහුණ දෙන්නාට ඔවුන් දිගටම කතා කරගෙන යාමට පෙර ඔවුන්ගේ සිතුවිලි හෝ හැඟීම් සකසා ගැනීමට අවශ්‍ය අවකාශය සහ කාලය ලබා දීමයි. එවැනි නිශ්ශබ්ද අවස්ථාවක දී කෙනෙකු අපහසුතාවයට පත් විය හැකි අතර, එබැවින් සම්මුඛ සාකච්ඡාවට පෙර සිසුන් සමග සම්මුඛ සාකච්ඡාවක් රඟ දැක්වීම හෝ පුහුණු වීම හොඳ උපාය මාර්ග යක් වනු ඇත. ඒ අනුව සිසුන්ට ඔවුන් විසින් මුහුණ දිය හැකි සම්මුඛ සාකච්ඡා අවස්ථා තේරුම් ගැනීමට ප්‍රමාණවත් උදාහරණ පෙන්විය යුතුය. තවද දුෂ්කර හා අනපේක්ෂිත අවස්ථා වලට මුහුණ දීම වාචික ඉතිහාසය සම්බන්ද සම්මුඛ සාකච්ඡා වල කොටසක් බවටත් ඒ මගින් සවන් දීමට ඉගෙනීම, කරුණාව පෙන්වීම, සහ සංවේදනය සමඟ විවිධ තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම වැනි වැදගත් ජීවන කුසලතා වර්ධනය වීමට හේතු විය හැකි බව ගුරුවරුන් අවධාරණය කල යුතුය.

# 3. සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වන්නන් තෝරා ගැනීම සහ කැමැත්ත ගැනීම

සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නකු තෝරාගැනීම පදනම් විය යුත්තේ දැනුවත් කැමැත්ත ලබා ගැනීමේ වැදගත් සංකල්පය මතයි. දැනුවත් කැමැත්ත යනු වාචික ඉතිහාසය සම්බන්ද ව්‍යාපෘතිය සහ එහි රාමුව පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමකින් ආරම්භ වන විවෘත සන්නිවේදන ක්‍රියාවලියකි. එයට සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන්නාගේ වගකීම් මෙන්ම ඕනෑම/සියලු සම්මුඛ සාකච්ඡාවට මුහුණ දෙන්නන් සමග ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැඹුරු සාකච්ඡාවක් ඇතුළත් වන අතර වාචික ඉතිහාසය සම්බන්ද ව්‍යාපෘතියට සහභාගී වීමට සම්මුඛ සාකච්ඡාවට මුහුණ දෙන්නාගේ එකගතාවය ලබා ගැනීමෙන් අවසන් වේ.

දැනුවත් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට සම්මුඛ සාකච්ඡාවේ අරමුණ, එය බෙදා ගත හැකි ආකාරය/ආකාරයන්, සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන්නාගේ දත්ත ගබඩා කරන ආකාරය/ආකාරයන් සහ ඔහු/ඇයගේ අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාවක් ඇතුළත් විය යුතුය. විශේෂයෙන්, ඔවුන්ට ව්‍යාපෘතියට සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය, සහභාගී වීමට එකග වූ පසුව පවා ඕනෑම වේලාවක සම්මුඛ සාකච්ඡාව නැවැත්වීමට ඇති අයිතිය සහ ඔවුන්ගෙන් අසන ඕනෑම විශේෂිත ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පිළිබඳව සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නන් දැනුවත් කළ යුතුය.

එපමණක් නොව දැනුවත් කැමැත්ත පිළිබඳ සියලු තොරතුරු ලිඛිතව සැපයිය යුතුය. තවද සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වේ යයි සිතන පුද්ගලයන්ගේ වැඩිදුර තොරතුරු රැස් කිරීමට පෙර ව්‍යාපෘතිය ආරම්භයේදීම ඔවුන්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

වාචික ඉතිහාසය සම්බන්ද සම්මුඛ සාකච්ඡාවක හොඳම භාවිතයන්ට ඒ සමස්ත ක්‍රියාවලියේ විනිවිදභාවය ඇතුළත් වේ. සම්මුඛ සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර, සම්මුඛ සාකච්ඡාවෙන් කුමක් සිදුවේද, ක්‍රියාත්මක වන ක්‍රියා පටිපාටි මොනවාද යන්න (ඕනෑම අවස්ථාවක සම්මුඛ සාකච්ඡාව නැවැත්වීමට ඔවුන්ට ඇති අයිතිය සහ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට ඇති අයිතිය වැනි) සහ තොරතුරු බෙදා ගන්නේ කවුරුන් සමගද යන්න පිළිබඳව සම්මුඛ සාකච්ඡාවට මුහුණ දෙන්නන් දැනුවත් කළ යුතුය. සිසුන්ට ව්‍යාපෘතිය හඳුන්වා දීමට පෙර අදාළ පාසල් නිලධාරීන් විසින් ව්‍යාපෘති අත් පත්‍රිකාවේ මෙම තොරතුරු ඉතා මැනවින් සඳහන් කර අනුමත කළ යුතුය.

සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නන්ට ඔවුන්ගේ කථා ප්‍රසිද්ධියේ බෙදා ගැනීමට අවශ්‍ය නොවන බව හෝ ඇතැම් බෙදාගැනීමේ ක්‍රම සඳහා (එනම්, උදාහරණයක් ලෙස ව්‍යාපෘතියේ කොටසක් ලෙස ඔවුන් පාසල් ප්‍රජාව සමඟ සම්මුඛ සාකච්ඡා බෙදා ගැනීමට කැමැත්ත ලබා දිය හැකි නමුත් පුළුල් ප්‍රජාවක් සමඟ ඒවා බෙදාගැනීමට අකැමති විය හැක) ඔවුන්ගේ කැමැත්ත සීමා කළ හැකි බව ගුරුවරුන් මතක තබා ගත යුතුය. එබැවින් සෑම වාචික ඉතිහාස ව්‍යාපෘතියකටම පහත අයිතම තුන ඇතුළත් වීම ඉතා වැදගත් වේ.

## තොරතුරු පත්‍රිකාව

මෙය ව්‍යාපෘතියේ පසුබිම සපයයි. වාචික ඉතිහාස ව්‍යාපෘතියේ අරමුණ කුමක්ද, එයට සම්බන්ද වී සිටින්නේ කවුරුද, එහි වැදගත්කම හා සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නාට වැදගත් දායකත්වයක් සැපයිය හැක්කේ මන්ද යන්න තොරතුරු පත්‍රිකාවේ සඳහන් විය යුතුය. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර සියලුම සිසුන්ට මෙම තොරතුරු පත්‍රිකාව ලබා දිය යුතු අතර එමගින් ඔවුන්ට ව්‍යාපෘතියේ අරමුණුවල පුළුල් රාමුව තේරුම් ගැනීමට හැක.

## කැමැත්ත ලබා දීම සඳහා වන ලිඛිත පෝරමය

මෙය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වේ යයි සිතන පුද්ගලයන්ගේ දැනුවත් කැමැත්ත ලබා දෙමින් තම අත්සන සටහන් කරන පෝරමයයි. මෙම ලිඛිත කැමැත්ත ලබා දෙන පෝරමයේ සම්මුඛ සාකච්ඡාව ආරම්භ වීමට පෙර එය මෙහෙයවන්නාගේ වගකීම් (ව්‍යාපෘතියේ වගකීම ඇතුලත්ව) සහ සහභාගී වන්නන්ගේ අයිතිවාසිකම් සම්බන්ද තොරතුරු ඇතුලත් විය යුතුය. කැමැත්ත ලබා දීම සඳහා වන ලිඛිත පෝරමය ලබා දීමට පෙර සිසුන්ට දැනුවත් කැමැත්ත යන සංකල්පය හඳුන්වා දිය යුතුය.

## පටිගත කිරීමට කැමැත්ත ලබා දෙන පෝරමය

මෙය ප්‍රකාශන හිමිකම් තොරතුරු සපයන පෝරමයයි. වාචික ඉතිහාස ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරන ලද ඕනෑම පටිගත කිරීමක් ගබඩා කිරීම සහ එහි භාවිතය මෙන්ම පටිගත කිරීම් සඳහා ප්‍රකාශන අයිතිය හිමි පාර්ශ්වයන් සම්බන්ධ දේශීය හෝ ප්‍රාදේශීය රෙගුලාසි මෙහි සඳහන් වේ.

# 4. සිසුන්ගේ පර්යේෂණාත්මක අධ්‍යයනය

තොරතුරු ගවේෂණය මගින් සිසුන් සිසුන් තම සම්මුඛ සාකච්ඡාව සඳහා සූදානම් වීම ආරම්භ කළ යුතුයි මෙම තොරතුරු ගවේෂණයට ඔවුන්ගේ අවධානය යොමු වන ඓතිහාසික සිදුවීම, කාල පරිච්ඡේදය හෝ තේමාව පිළිබඳ සාමාන්‍ය විමර්ශනයක් ඇතුළත් විය යුතුයි.

ඔවුන් දැනට පවතින ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර තුලින් මාතෘකාව පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි නිසා ඔවුන් මාතෘකාව සම්බන්දව හැකි තරම් මූලාශ්‍ර වර්ග සෙවිය යුතුයි සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නා පිළිබඳවද මූලික විමර්ශන කිහිපයක් ද පැවැත්විය යුතුයි ඒ මගින් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නා සමග පළමුවෙන් සැහැල්ලු හමුවීමක් ආරම්භ කිරීමට හැකි වන අතර මේ මගින් දෙදෙනාටම ක්‍රියාවලිය පහසු කරන අතර මුලික තොරතුරු රැස් කිරීමට ඉඩ සලසයි.

සිසුන්ට ක්‍රියාවලිය දිග හැරෙන ආකාරය පිළිබඳ දළ අදහසක් මෙහි දී ඉදිරිපත් කළ හැකි අතර සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නාට ඇති ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට කාලය ලබා දිය හැකියි අත්‍යවශ්‍ය පසුබිම් තොරතුරු (දිනයන්, ස්ථාන , ආදිය) ලබා ගැනීමට සිසුන්ට ප්‍රශ්න ඇසීමට හැකි අතර අවශ්‍ය නම් පවුලේ සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු රැස් කර ගැනීමට අවස්ථාව ඇති පින්තූර, උප්පැන්න සහතික, ලිපි යනාදිය වැනි ඕනෑම කෞතුක වස්තු සහ වාර්තා බෙදා ගැනීමට ඔවුන් කැමති දැයි යන්නද ඔවුන්ට මෙහි දී ඇසිය හැකි ඕනෑම සංවේදී පුද්ගලික ලේඛන හෝ තොරතුරු ගබඩා කර ඇති ආකාරය පිළිබඳව සිසුන් සහ පාසල් ප්‍රවේශම් විය යුතුයි සිසුන්ට ඔවුන්ගේ මූලික සම්මුඛ සාකච්ඡා අත්දැකීම් සහ සොයාගැනීම් එකිනෙකා සමඟ බෙදා ගැනීම සහ සමහර මිතුරන්ගේ අදහස් හා ප්‍රතිචාර ඉදිරිපත් කිරීම මෙම අදියරේදී ප්‍රයෝජනවත් විය හැකියි ප්‍රශ්න ලිවීමේදී අවධානය යොමු කළ යුතු කරුණු හඳුනා ගැනීමට හෝ සම්පූර්ණ සම්මුඛ සාකච්ඡාවට පෙර වැඩි දුරටත් ගවේෂණය කල යුතු කරුණු හඳුනා ගැනීමට මෙය උපකාරයක් විය හැක.

# 5. ප්‍රශ්න නිර්මාණය

සිසුන් දැන් මූලික පර්යේෂණ සහ අවධානය යොමු කිරීමට තෝරාගත් තේමා මත පදනම්ව ප්‍රශ්න ලැයිස්තුවක් සකසා ගත යුතුය. මෙම ප්‍රශ්න ලිවීම සඳහා වන පොදු උපදෙස් අතරට පහත සඳහන් දෑ ඇතුලත් වේ : ගැනීමට මෙය උපකාරයක් විය හැක.

- **සෑම විටකම සංවෘත්ත නොව විවෘත ප්‍රශ්න ඇතුලත් කරන්න**

  ඒ මගින් වැඩි තොරතුරු ප්‍රමාණයක් රැස් කරගත නොහැක. නමුත් විවෘත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සහභාගීවන්නා වඩා ගැඹුරට පිළිතුරු ලබා දිය යුතුය.

විවෘත ප්‍රශ්නයකට උදාහරණයක්: "ඔබ ඔබේ උපන් නගරයෙන් පිටත් වූයේ ඇයි?"

ප්‍රයෝජනවත් විවෘත ප්‍රශ්න ශබ්දප්‍රකෘති ස්කන්ධ: "කෙසේද", "ඇයි", "ඔබට විස්තර කළ හැකිද...?"

## උත්තරය හඟවන ප්‍රශ්න නොඇසීම

උත්තරය හඟවන ප්ප්‍රශ්න යන්නෙන් අදහස් කරන්නේ යම් උත්තරක් දීමට සහභාගී වන්නාව යොමු කරන ප්‍රශ්න යන්නයි. උදාහරණයක් ලෙස: "ඔබේ දෙමාපියන් නිසා ඔබ වෙනත් ප්‍රදේශයකට ගියාද?"

## සංවේදී කරුණු පිළිබඳ ප්‍රශ්න ඇසීම පිළිබඳව ප්‍රවේශම් වන්න

පර්යේෂණයේ මාතෘකාවට එය අත්‍යවශ්‍ය නොවේ නම්, ඕනෑවට වඩා සංවේදී කරුණු පිලිබඳ ප්‍රශ්න නොඇසීමට සිසුන් උත්සාහ කළ යුතුය. පර්යේෂණය සංවේදී මාතෘකාවක් මත නම් සහ සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නා මෙම මාතෘකාව සාකච්ඡා කිරීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ නම්, සිසුන් ඔවුන් අසන ප්‍රශ්න වර්ග සහ ඒවා ඉදිරිපත් කරන ආකාරය ගැන සැලකිලිමත් විය යුතුය. ඒ අනුව සිසුන්ට වැඩි අවබෝධයක් නැති සංවේදී කරුණු පෙන්වා දීම සඳහා ඔවුන් සම්මුඛ සාකච්ඡාවට පෙර සිසුන් විසින් සැකසු ප්‍රශ්න පරීක්ෂා කිරීමට ගුරුවරුන් වග බලා ගත යුතුය.

## ප්‍රශ්න ඉවත් කිරීමට, වෙනස් කිරීමට සහ එක් කිරීමට සූදානම් විය යුතුය

සම්මුඛ සාකච්ඡාව අතරතුර ශිෂ්‍යයා තම කාලයෙන් වැඩි කාලයක් ගත කළ යුත්තේ සවන්දීම සඳහා වන අතර සංවාදය අතරතුර ඔවුන්ගේ ප්‍රශ්න  සාකච්ඡාව යන ආකාරය අනුව හැඩගැස්වීමට සූදානම් විය යුතුය. සම්මුඛ සාකච්ඡාව සඳහා සූදානම් වීමේදී සිසුන්ට දිගු ප්‍රශ්න ලැයිස්තුවක් සැකසිය හැකි නමුත් ඒ සියලු ප්‍රශ්න ඇසිය යුතුය යන ආකල්පයකින් සාකච්ඡාවට සහභාගී නොවීම වැදගත් වේ. අත්‍යවශ්‍ය ප්‍රශ්න කිහිපයකට ප්‍රමුඛත්වය දීම මෙහි දී ප්‍රයෝජනවත් විය හැකිය. රොබෝවරු ලෙස ප්‍රශ්න ලැයිස්තුව එකින් එක නොඇසීම වැදගත් වේ. සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන පුද්ගලයා වෙනත් ප්‍රශ්නයකට ප්‍රතිචාර දක්වන අතරතුර එම ප්‍රශ්නයට දැනටමත් උත්තර සපයා ඇත්නම් හෝ අර්ධ වශයෙන් උත්තර සපයා ඇත්නම් එම ප්‍රශ්නය වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට සිසුන්ට සිදු විය හැකිය. ඒ හා සමානව, ඔවුන් උනන්දුවක් දක්වන සහභාගී වන්නා විසින් මතු කරන ලද අදහස්, කථා හෝ ගැටළු පිළිබඳව වැඩිදුර සොයා බැලීම සඳහා පසු විපරම් ප්‍රශ්න සාකච්ඡාවට එකතු කළ යුතුය.

ප්‍රයෝජනවත් පසු විපරම් ප්‍රශ්න ශබ්දප්‍රකෘති ස්කන්ධ: "ඔබට මට මේ පිළිබඳව තව කියන්න පුලුවන්ද...?", "ඔබ ඔ ගැන සඳහන් කළා, ඔබට මේ පිළිබඳව තව ටිකක් පැහැදිලි කරන්න පුළුවන්ද කුමක්/ඇයි/කෙසේද...?"

# 6. සම්මුඛ සාකච්ඡා පැවැත්වීම

සිසුන් පෞද්ගලිකව එම පුද්ගලයා හමු වී සම්මුඛ සාකච්ඡාව පැවැත්වීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. තවද එම පුද්ගලයාට වඩාත් පහසු ස්ථානයක හමුවීමට සිසුන්ව දිරිමත් කළ යුතුය. මෙහි දී සිසුන්ට ඒ පිටුපස කතාවක් ඇති ස්ථානයක් සම්මුඛ සාකච්ඡාව සඳහා තෝරා ගැනීමට උත්සාහ කළ හැකිය - උදාහරණයක් ලෙස සම්මුඛ සාකච්ඡාව සාලයක හෝ කාර්යාලයක මේසයක් ඉදිරියේ පැවැත්වීම අනිවාර්ය නොවේ. සිසුන් ආහාර පිසීමට හෝ පැසිපන්දු ක්‍රීඩා කිරීමට හෝ මෝටර් රථවල වැඩ කිරීමට කැමති පුද්ගලයකු සම්මුඛ සාකච්ඡාව සඳහා තෝරා ගන්නේ නම්, ඔවුන්ට සම්මුඛ සාකච්ඡාව මුළුතැන්ගෙයෙහි හෝ පැසිපන්දු පිටියක හෝ ගරාජයක පැවැත්විය හැකිය. කෙසේ වෙතත්, එවැනි ස්ථානයක් භාවිතා කරන්නේ නම්, සිසුන් ශ්‍රව්‍ය පටිගත කිරීම සඳහා එහි පසුබිම් ශබ්දය සුදුසු දැයි සැලකිලිමත් විය යුතුය (සහ ඔවුන් වීඩියෝ රූගත කරන්නේ නම් එහි ආලෝකය පිළිබඳව). තවද අවම වශයෙන් පටිගත කිරීමට උපකරණ වර්ග දෙකක් හෝ භාවිතා කිරීමට සිසුන් දිරිමත් කළ යුතු අතර හැකි සෑම විටකම එම උපකරණ චාජ් කිරීම සඳහා ප්ලග් පොයින්ට් එකකට සම්බන්ද කර තැබිය යුතුය. එපමණක් නොව විදුලිය විසන්ධි වුවහොත් භාවිතා කිරීම සඳහා සිසුන් වෙනත් විකල්ප තමන් සන්තකයේ තබා ගැනීමද වැදගත් වේ. පටිගත උපකරණ දෙකක් යොදා ගැනීම මෙහිදී යෝජනා කරන්නේ හදිසියේ පටිගත කිරීමක් නැති වුවහොත් මුහුණ දීමට සිදුවන ගැටළුව මගහරවා ගැනීම සඳහාය.

සිසුන් එක් එක් සම්මුඛ සාකච්ඡාව පටිගත කිරීම ආරම්භ කළ යුත්තේ පහත සඳහන් දෑ හඳුන්වා දීමෙන් පසුවයි:

- ඔවුන්ගේ නම, වයස/ශ්‍රේණිය සහ ස්ථානය
- දිනය සහ වේලාව (පටිගත කිරීම ආරම්භයේදී)
- සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නාගේ නම
- වාචික ඉතිහාස ව්‍යාපෘතිය (මෙය පන්තියක හෝ කණ්ඩායම් සාමූහිකයක කොටසක් නම්)
- සම්මුඛ  සාකච්ඡාව අතරතුර ඔවුන් සමඟ කාමරයේ සිටින වෙනත් ඕනෑම පුද්ගලයෙක්

සම්මුඛ සාකච්ඡාව සාමාන්‍යයෙන් එහි මුළු කාලයම තුල නතර නොකර හෝ විරාමයකින් තොරව එකවර පටිගත කළ යුතුය. තවද කිසියම් හේතුවක් නිසා සම්මුඛ සාකච්ඡාවක් නතර කළහොත්, පටිගත කිරීම නැවැත්වූ හේතුව සමඟ හැඳින්වීම නැවත පැහැදිලිව සඳහන් කළ යුතුය.

සම්මුඛ සාකච්ඡාව අවසානයේ සිසුන් පහත සඳහන් දෑ සඳහන් කළ යුතුය:

- “මෙය (සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ පුද්ගලයාගේ නම) සමග සිදු කල සම්මුඛ සාකච්ඡාවකි”
- දිනය සහ වේලාව (පටිගත කිරීම අවසානයේ)
- අවසාන වශයෙන්, “මෙය සම්මුඛ පරීක්ෂණයේ අවසානයයි.” යනුවෙන් සිසුන් පැවසිය යුතුය

පටිගත කිරීමේ උපකරණය ක්‍රියා විරහිත කළ පසු ශිෂ්‍යයාට සහ සහභාගී වූ පුද්ගලයාට කෙටි ආවර්ජනයක යෙදිය හැක. ශිෂ්‍යයාට එම පුද්ගලයාගෙන් ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අදහස් හෝ ඔවුන්ට යමක් අපහසු වූයේ නම් සහ වෙනත් දෑ පිළිබඳව ඇසීමට හැකිය. සම්මුඛ සාකච්ඡාවේ අපහසු හෝ ගැටළුකාරී පැති තිබේ නම්, සිසුන් ඔවුන්ට සහාය අවශ්‍ය දැයි අධ්‍යනය කර ඉදිරියට යාමට හොඳම මාර්ගය තීරණය කිරීම සඳහා තම ගුරුවරයා සමඟ සාකච්ඡා කළ යුතුය.

# 7. පිටපත් කිරීම

පිටපත් කිරීම යනු වාචික ඉතිහාස සම්මුඛ සාකච්ඡාවේ දී වාචිකව ඉදිරිපත් කල කරුණු ලිඛිතව සටහන් කිරීමේ ක්‍රියාවලියයි. මුල් පටිගත කිරීම නැති වූ විට හෝ හානි වූ විට මෙලෙස පිටපත් කිරීම මගින් සම්මුඛ සාකච්ඡාව ආරක්ෂා කරයි. තවද සියළු දෙනා ඇතුලත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා පිටපත් කිරීම පුළුල් ප්‍රවේශයක් සපයයි. සම්මුඛ  සාකච්ඡා සම්පූර්ණ කිරීමෙන් පසු, සෑම සිසුවෙකුටම එය පිටපත් කිරීමට උනන්දු කළ යුතුය. පිටපත් කිරීම යනු සම්මුඛ සාකච්ඡාවට සවන් දීම සහ විරාමයන් මෙන්ම විවේක ඇතුලත්ව වචනයෙන් වචනය ටයිප් කිරීමයි. මෙයින් අදහස් කරන්නේ ප්‍රශ්න ඇතුළුව සම්මුඛ සාකච්ඡාවේ සෑම වචනයක්ම ටයිප් කළ යුතු බවයි. පිටපත් කිරීම යනු අධික කාලයක් ගතවන ක්‍රියාවලියකි!

සම්මුඛ සාකච්ඡාව පිටපත් කිරීමේදී, සහභාගිවන්නා සාකච්ඡා කරන විෂයයන් වෙනස් කරන විට එය තේමා සහ/හෝ මාතෘකා ලෙස වෙන් කිරීමට සිසුන් උනන්දු කළ යුතුය. එසේම, සිසුන් පසුව පිරික්සීම පහසු කිරීම සඳහා කාල සලකුණු ඇතුළත් කළ යුතු අතර තවද ක්ෂණිකව සටහන් ගබඩා කරන ගූගල් ඩොක්ස් වැනි මාර්ගගත වැඩසටහනක් භාවිතා කිරීමට සිසුන් දිරිමත් කළ යුතුය. එපමණක් නොව පිටපත් කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු සම්මුඛ සාකච්ඡාවේ කෙටි සාරාංශයක් ලෙස වාක්‍ය 4-5කින් ලිවීමට සිසුන් දිරිමත් කිරීම යෝග්‍ය වේ.

පිටපත් කළ සම්මුඛ සාකච්ඡාවක උදාහරණයක් මෙලෙස දැක්විය හැක:

දිනය: 2019 මාර්තු 11

සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන පුද්ගලයා: ශාමේන් මැන්දිස්

සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන්නා: ටහාන් ජයවර්ධන සහ ෂාසා ෂාමි

ස්ථානය: කොළඹ, ශ්‍රී ලංකාව

පිටපත: සජිනි දෙව්මිණි

**0:20 විනාඩිය**

**ටහාන්:** ඉතින් මගේ නම ටහාන්. මා මෙහි සිටින්නේ සෙසු ශිෂ්‍ය ෂාසා සමගයි. අද 2019 මාර්තු 11 වන දින වන අතර අපි පැමිණ සිටින්නේ කොළඹ, නාවල නගරයටයි. අප සමග සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන්නේ ශාමේන් මැන්දිස්. අපි දැන් කොටස් තුනකින් යුත් සම්මුඛ සාකච්ඡාවේ පළමු කොටස ආරම්භ කරනවා.

**0:36 විනාඩිය**

**ටහාන්:** ඉතින් ම්ම්... ඔයා ඉපදුනේ කවදාද කොහෙද?

**0:40 විනාඩිය**

**ශාමේන්:** මම ඉපදුනේ 1934 කොළඹ දී

**0:47 විනාඩිය**

**ටහාන්:** ම්ම්... ඔයා කොහෙද ජීවත් වුනේ? එතකොට ඉස්කෝලේ ගියේ?

# 8. සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා සමග සමාලෝචනයක යෙදීම

පිටපත් කිරීම සම්පූර්ණ වූ පසු, සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා සමඟ පිටපත සහ/හෝ මුල් පටිගත කිරීම බෙදාගත යුතුය. ඉන් පසුව සහභාගී වූ පුද්ගලයින්ට සම්මුඛ සාකච්ඡාව ගැන හෝ සම්මුඛ සාකච්ඡාව ගබඩා කර බෙදා ගන්නේ කෙසේද යන්නට අදාලව ඊළඟ පියවර පිළිබඳව තමන්ට ඇති ඕනෑම කනස්සල්ලක් මතු කිරීමට අවස්ථාව තිබේ. මෙහිදී ශිෂ්‍යයන් සහ සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාග වන්නන් සමාග එක්ව, සමාලෝචනය කළ යුතු අතර, අවශ්‍ය නම්, එකඟතාවය ලබා දුන් ගිවිසුම සහ නිදහස් කිරීමේ ගිවිසුම සංශෝධනය කළ හැක.

# 9. විශ්ලේෂණය

මීළඟ පියවර වන්නේ සිසුන්ට ඔවුන්ගේ සම්මුඛ සාකච්ඡාව ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සහ එහි ඓතිහාසික කතාවන්ට ඇති සම්බන්ධය විශ්ලේෂණය කිරීමයි. මෙම ක්‍රියාවලියේ කොටස් තනි තනිව සිදු කළ හැකි වුවද, සිසුන්ට අදහස් හුවමාරු කර ගැනීමට සහ සම්මුඛ සාකච්ඡා වල විවිධ පැති එකට සලකා බැලීමට අවස්ථාව සැලසීම ද වටී. ඔවුන්ගේ සම්මුඛ සාකච්ඡා විශ්ලේෂණය කරන විට, ඔවුන්ට සලකා බැලිය හැකි විවිධ අංග සහ පැති තිබේ. පහත සඳහන් සියල්ල ආවරණය කිරීමට නොහැකි විය හැක, නමුත් පහත ලැයිස්තුවෙන් විමර්ශනය කළ යුතු ක්ෂේත්‍ර පිළිබඳ සමහර අදහස් සහ සිසුන්ගේ වයස සහ හැකියාව අනුව සලකා බැලිය හැකි ප්‍රශ්න සපයයි.

## සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නාගේ බලපෑම

සිසුන් තම ප්‍රශ්න තෝරා ගැනීම සහ සම්මුඛ සාකච්ඡාව සඳහා ගත් ප්‍රවේශය සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නාගේ වාචික සාක්ෂිය හැඩගස්වා ඇත්තේ කෙසේදැයි සලකා බැලිය යුතුය. තවද සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා සහ මෙහෙයවන්නා අතර ඇති සම්බන්ධය සාක්ෂියට බලපාන්නේ කෙසේද යන්න ද ඔවුන් විසින් සලකා බැලිය යුතුය.

ප්‍රශ්න වලට උදාහරණ:

- සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන්නාගේ ප්‍රශ්න කථකයාගේ සාක්ෂිය හැඩගස්වන්නේ කෙසේද?
- ප්‍රශ්න වාර ගණන සහ වර්ගය සම්මුඛ සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නාට බලපාන්නේ කෙසේද?
- සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා සහ මෙහෙයවන්නා අතර ඇති සම්බන්ධය සාක්ෂියට බලපාන්නේ කෙසේද?

  (උදා. ඔබේ මිත්තනිය ලෙස ඇය ඔබට පැවසීමට අකමැති සමහර දේවල් තිබේද? ඔබ එකම පවුලේ සාමාජිකයින් වන නිසා ඇය සාකච්ඡා කිරීමට ඉඩ ඇති සමහර දේවල් තිබේද?)

## සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නාගේ පුද්ගල නිශ්‍රිතභාවය හා සාකච්ඡාවේ දී පෙන්වූ ක්‍රියාකාරීත්වය

මෙහි දී සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නාගේ ජීවන අත්දැකීම්, පුද්ගලික අදහස්, පසු විපරුම් හා අර්ථ නිරූපනයන් වලින් සමන්විත වූ සම්මුඛ සාකච්ඡාවල ඇති නිශ්‍රිතභාවය ගවේෂණය කරයි. සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා ප්‍රේක්ෂකයන්ට (සම්මුඛ සාකච්ඡාවට සහභාගීවන්නා සහ පටිගත කිරීම දැකීමට හෝ ඇසීමට හැකි ඕනෑම කෙනෙකුට) තමන්ව නිරූපණය කිරීමට තෝරා ගන්නා ආකාරය පිළිබඳව ද සිසුන් සලකා බැලිය යුතුය

ප්‍රශ්න වලට උදාහරණ:

- කථකයාගේ අනන්‍යතාවය පිළිබඳ හැඟීම ඔවුන්ගේ වාචික සාක්ෂියට බලපාන්නේ කෙසේද?
- ඔවුන් ප්‍රකාශ කරන පුද්ගලික අදහස් මොනවාද?
- සම්මුඛ සාකච්ඡාවේ වේලාව සහ සන්දර්භය ඔවුන් දකින ආකාරයට බලපාන්නේ කෙසේද?
- ප්‍රේක්ෂකයින් නිසා කථකයා ඔවුන් පවසන දෙය හෝ ඒ දෙය ඔවුන් පවසන ආකාරය වෙනස් කරන්නේ කෙසේද?

## මතකය, අමතක වීම සහ නිශ්ශබ්දතාවය

මතක් කර ඇති දෑ, කෙසේ මතක් කරගෙන ඇතිද හා ඒවා මතක් කරගෙන තිබෙන්නේ ඇයි යන්න සිසුන් හොඳින් සිතා බැලිය යුතුය. තවද සාකච්ඡාව අතර අමතක වූ දෑ හා එසේ වීමට හේතු සිසුන් විසින් සලකා බැලිය යුතුය.

ප්‍රශ්න වලට උදාහරණ:

- කථකයාට මතක් වී ඇත්තේ මොනවද සහ ඔවුන්ට ඒවා මතක තබා ගත හැක්කේ ඇයි?
- ඔවුන්ට අමතක වූ දෙයක් තිබේද? මෙසේ විය හැක්කේ ඇයි?
- මෙම සිදුවීම් පිළිබඳ 'සාමූහික' මතකයන් මගින් කථකයා ගේ මතකය හැඩගැසෙන්නට ඇත්තේ කෙසේද?
- සම්මුඛ සාකච්ඡාව සිදුවන සන්දර්භය (කාලය, ස්ථානය, ආදිය) කථකයා මතක තබා ගන්නා ආකාරය කෙරෙහි බලපාන්නේ කෙසේද?
- සම්මුඛ සාකච්ඡාවේදී සාකච්ඡා නොකළ මාතෘකා තිබේද? මෙයට හේතුව කුමක් විය හැකිද? සලකා බලන්න: වැදගත්, පුද්ගලික, තහනම් ලෙස සලකන දේ.
- සම්මුඛ සාකච්ඡාවකදී නොකියන දෙයින් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද?

## වාචික නොවන සන්නිවේදනය

කථකයා කතා කරන ආකාරය සහ චලනය වන ආකාරය ඔවුන්ගේ සාක්ෂිය අර්ථ නිරූපණය කිරීමට උපකාරී වන්නේ කෙසේදැයි සිසුන් සලකා බැලිය යුතුය (ගැඹුරු සවන්දීම වෙත ආපසු සම්බන්ධ කිරීම).

ප්‍රශ්න වලට උදාහරණ:

- කථකයා කතා කරන ආකාරය ගැන ඔබ දකින්නේ කුමක්ද? (උච්චාරණය, ස්වරය, වේගය)
- සම්මුඛ පරීක්ෂණය පුරාම මෙය වෙනස් වේද? මෙය සිදු විය හැක්කේ ඇයි?
- මෙම අංගයන් ගෙන් ඔවුන්ගේ කතාව ගැන අපට ඉගෙනගත හැක්කේ කුමක්ද?

## කතාවන්

ශිෂ්‍යයන් විසින් කතාවන් සැකසී ඇති ආකාරය සහ ඒවා වෙනත් කතා හෝ කතා ආකෘති පිළිබිඹු කරන හෝ ප්‍රතික්ෂේප කරන ආකාරය පරීක්ෂා කළ යුතුය.

ප්‍රශ්න වලට උදාහරණ:

- මෙම සම්මුඛ සාකච්ඡාවේදී කථකයා විසින් භාවිතා කරන කතා ලක්ෂණ මොනවාද? (උදා: තේමා, අරුත්, ප්‍රභේද, චරිත එනම් ප්‍රධාන චරිතය / විරුද්ධවාදියා යන්න)
- මෙය ඔවුන්ගේ සාක්ෂිය අප තේරුම් ගන්නා ආකාරය කෙරෙහි බලපාන්නේ කෙසේද?
- සම්මුඛ සාකච්ඡාව වෙනත් කතා සමඟ සමපාත වන්නේ හෝ ඒවාට අභියෝග කරන්නේ කෙසේද?

## සම්මුඛ සාකච්ඡාවේ නිරවද්‍යතාවය සහ සාමාන්‍යකරණය

නිරවද්‍යතාවය සහ සාමාන්‍යකරණය විශ්ලේෂණය කිරීම සඳහා සිසුන්ට අභ්‍යන්තර ගැලපීම සඳහා සම්මුඛ පරීක්ෂණය පරීක්ෂා කිරීමට අවශ්‍ය වනු ඇත. එමෙන්ම එය වෙනත් ප්‍රභවයන් සමඟ සංසන්දනය කළ යුතුය.

වාචික සාක්ෂියක නොගැලපීම් අඩංගු විය හැකි බවත් වාචික ඉතිහාසය නිරවද්‍යතාව සම්බන්දයෙන් නිශ්චිත අභියෝගවලට මුහුණ දිය හැකි බවත් සිසුන් තේරුම් ගත යුතුය. තවද කරුණු සුළු ලෙස නිවැරදි නොවිය හැකි බවත් ඒ හේතුවෙන් සමස්ත මූලාශ්‍රයම නිෂ්ඵල නොවන බවත් සිසුන් අවබෝද කර ගත යුතුය. සිසුන් මූලාශ්‍රයක සාමාන්‍යකරණය ද සලකා බැලිය යුතුය. සාමාන්‍යකරණය අවශ්‍යයෙන්ම සම්මුඛ පරීක්ෂණයේ සත්‍යතාව පිළිබඳව කරුණු කෙරෙහි අවධානය යොමු නොකරන අතර ඒ වෙනුවට සම්මුඛ සාකච්ඡාවේදී ප්‍රකාශිත අදහස්, හැඟීම්, අත්දැකීම්, අදහස් සහ යනාදිය එකම කණ්ඩායමට අයත් අනෙකුත් අය නියෝජිතය වන ආකාරය කෙරෙහි අවධානය යොමු කරයි.

ප්‍රශ්න වලට උදාහරණ:

- සාක්ෂිය වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන කරුණු සමඟ කෙතරම් දුරට ගැලපේද?
- සාක්ෂියේ කිසියම් අභ්‍යන්තර නොගැලපීම් හෝ සාවද්‍ය භාවයක් තිබේද?
- නිරවද්‍යතාවයේ ගැටළු මූලාශ්‍රයේ ප්‍රයෝජනයට කෙතරම් දුරට බලපාන්නේද?
- වෙනත් සම්මුඛ සාකච්ඡා හෝ මූලාශ්‍රවල ප්‍රකාශිත අදහස් සමඟ සාක්ෂිය කෙතරම් දුරට ගැලපේද?
- මෙම සම්මුඛ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද හැඟීම් හා අදහස් එහි සිටි හෝ එකම කණ්ඩායමට අයත් වෙනත් අය විසින්ද ප්‍රකාශ කරන ලද්දේ ද?
- සම්මුඛ සාකච්ඡාව පිළිබඳ අපගේ අර්ථ නිරූපණයට මෙය බලපාන්නේ කෙසේද?

# 10. ඉදිරිපත් කිරීම

ක්‍රියාවලියේ අවසාන පියවර වන්නේ සිසුන්ට ඔවුන්ගේ සොයාගැනීම් පෙන්වන ඉදිරිපත් කිරීමක් සැකසීමයි. මෙය සිසුන්ට තෝරාගැනීමට භාර දිය හැක, නැත්නම්ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ගුරුවරයා විසින් තීරණය කළ හැක.

සිසුන්ට ඔවුන්ගේ වැඩ ඉදිරිපත් කළ හැකි සමහර ක්‍රම වන්නේ:

- වීඩියෝ හෝ වාර්තාමය වැඩසටහනක්
- පොඩ්කාස්ට්
- ප්‍රදර්ශනයක් (මෙයට පාඨ, රූප, ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය සහ වස්තු වල එකතුවක් ඇතුළත් විය හැක)
- ලිඛිත රචනාවක් : චරිතාපදාන හෝ විශ්ලේෂණාත්මක

සම්මුඛ සාකච්ඡාවෙන් ඍජු උපුටා ගැනීම් සහ ඔවුන්ගේම විශ්ලේෂණය සහ විවරණ සමබර කරන්නේ කෙසේද යන්න පිළිබඳව සිසුන් හොඳින් සිතා බැලිය යුතුය.

## කැටලොග් කිරීම

වාචික ඉතිහාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වන පුද්ගලයින් හා මතුකරගත් ඓතිහාසික හා චරිතාපදාන තොරතුරු රැකගැනීම පිළිබඳව බරපතල වගකීමක්
දරයි. මේ වගකීම ඔවුන්ට ඉතා පැහැදිලිව කියා දිය යුතුයි. එබැවින් සිසුන් ඔවුන් විසින් නිර්මාණය කරන ලද වාචික ඉතිහාසය ආරක්ෂා කර ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, ඉදිරිපත් කිරීම් අවසන් වූ පසු ඒවා ගබඩා කරන ස්ථානය හා බෙදා ගන්නා ආකාර පිළිබඳව සිසුන් ප්‍රවේශම් විය යුතු මෙන්ම දැනුවත් විය යුතුය. ඔවුන් එබැවින් මේවා සංරක්ෂණය කිරීම සඳහා දේශීය ලේඛනාගාර, මාර්ගගත ගබඩා සහ වෙනත් දේ තුළ සම්මුඛ සාකච්ඡා සහ ආශ්‍රිත ද්‍රව්‍ය ලැයිස්තුගත කිරීම වැනි විකල්ප සලකා බැලිය යුතුය. කෙසේ වෙතත්, ඕනෑම බාහිර ආයතනයක් සමඟ ද්‍රව්‍ය හෝ තොරතුරු බෙදා ගැනීමට පෙර සිසුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ පුද්ගලයින් ගෙන් කැමැත්ත ලබා ගැනීම අතිශයින්ම වැදගත් වේ.

# II.



# සියලු අදහස් ගැනීම කිරීම සඳහා උපාය මාර්ග

### පහල හැකියා මට්ටමක සිටින සිසුන්ට සහය වීම

සමහර සිසුන්ට වාචික ඉතිහාස ව්‍යාපෘතියක පරිමාණය ඉතා අභියෝගාත්මක විය හැකි අතර, එවැනි අවස්ථාවක ඔවුන්ගේ අවශ්‍යතා අනුව ව්‍යාපෘතිය කෙටි කිරීම සුදුසු විය හැකිය. නිදසුනක් වශයෙන්, ඔවුන්ට නව සම්මුඛ සාකච්ඡාවක් මෙහෙය වීමට ඉඩ දෙනවට වඩා ව්‍යාපෘතිය කිරීමට පවතින පටිගත කිරීමක් ලබා දිය හැක හැකිය. ශිෂ්‍යයා සම්මුඛ සාකච්ඡාවක් විශ්ලේෂණය කර ඔවුන්ගේ සොයාගැනීම් සුදුසු ආකෘතියකින් ඉදිරිපත් කිරීමට සැලැස්වීමේ ද සැලකිය යුතු ඉගෙනුම් වටිනාකමක් ඇත. විකල්පයක් ලෙස, ඔබට වැඩ බෙදා ගැනීමට හැකි වන පරිදි එකට වැඩ කිරීමට සිසුන් යුගල වශයෙන් කණ්ඩායම් කල හැක. ඒ අනුව සිසුන් දෙදෙනා අතර කාර්යයන් බෙදා දිය හැක, නිදසුනක් වශයෙන්, එක් අයෙකුට සම්මුඛ සාකච්ඡා ක්‍රියාවලියට නායකත්වය දිය හැකි අතර අනෙකාට පිටපත ලිවීමේ වගකීම පැවරිය හැක.

### විශේෂ ඉගෙනුම් අවශ්‍යතා සහිත සිසුන්ට සහය වීම

විශේෂිත ඉගෙනුම් අවශ්‍යතා ඇති සිසුන්ට වාචික ඉතිහාස ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීමේදී විවධ අභියෝගවලට මුහුණ දිය හැකිය. පන්තියේ තනි තනි සිසුන් පිළිබඳව දැනුමක් ඇති ගුරුවරුන් ඒ සිසුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමට වඩාත් සුදුසු පුද්ගලයින් වන අතර මෙහිදී අප සමහර ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳව යෝජනා කිහිපයක් පහතින් සපයා ඇත:

- ඔටිසම් තත්වයන් ඇති සිසුන් සම්මුඛ සාකච්ඡාවේ අංග, විශේෂයෙන් වාචික නොවන ඉඟි අර්ථකථනය කිරීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දිය හැකිය. සම්මුඛ සාකච්ඡාව සහ විශ්ලේෂණය සහයෝගීව සම්පූර්ණ කිරීම සඳහා සිසුන් යුගල වශයෙන් වැඩ කිරීම ප්‍රයෝජනවත් විය හැකිය.

- ශ්‍රවණ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන සිසුන්ට ව්‍යාපෘතියේ අවසාන කොටස සම්පූර්ණ කිරීම සඳහා පෙර වාර්තා කල සහ පිටපත් කරන ලද සම්මුඛ පරීක්ෂණයක් සමඟ කෙලින්ම වැඩ කිරීමෙන් ප්‍රතිලාභ ලැබිය හැකිය, එවිට ඔවුන්ට එකවර කියවීමට සහ සවන් දීමට හැකිය. බොහෝ ඔන්ලයින් වාචික ඉතිහාස ලේඛනාගාර වාර්තාගත සම්මුඛ සාකච්ඡා සමඟ ලිඛිත පිටපත්ද සපයයි.

- ඩිස්ලෙක්සියා හෝ ලිවීමේ අපහසුතා ඇති සිසුන්ට පිටපත් කිරීමේ ක්‍රියාවලියේ කොටස් ස්වයංක්‍රීයව සිදු කරන යෙදුම් සහ ඔන්ලයින් මෙවලම් ප්‍රයෝජනවත් විය හැක. අන්තර්ජාලයේ 'පිටපත් කිරීමේ මෘදුකාංග' හෝ ඒ හා සමාන සෙවීමක් ප්‍රතිඵල විශාල ප්‍රමාණයක් සපයනු ඇත

**පහල හැකියා මට්ටමක සිටින සිසුන්ට සහය වීම**

වාචික ඉතිහාස ව්‍යාපෘතියේදී උසස් අධ්‍යාපනය ලබන සිසුන්ටද අභියෝග ඇති විය හැකි විවිධ අවස්ථා තිබේ. පහත එවැනි අවස්ථා දෙකක් ඇතුළත් වේ:

- සංසන්දනය කිරීමට සහ ගැඹුරු විශ්ලේෂණය සඳහා එකම තේමා හෝ තේමාව කෙරෙහි අවධානය යොමු කර පවුලේ විවිධ සාමාජිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වන ලෙස ශිෂ්‍යයාගෙන් ඉල්ලා සිටින්න.

- ගැඹුරු විවේචනාත්මක ව්‍යුහයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයා තෝරාගත් තේමා හෝ තේමාව සම්බන්ධ ඓතිහාසික මූලාශ්‍ර පරාසයක් භාවිතා කරමින් අමතර පර්යේෂණ සිදු කරන ලෙස ඉල්ලා සිටින්න.



# III.



## භාවිතා වන උපායමාර්ගය

ශ්‍රී ලංකාව (එවකට සිලෝන් ලෙස හැඳින් වූ) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් ලෙස මිත්‍ර පාක්ෂිකයකු ලෙස දෙවන ලෝක යුද්ධයට සම්බන්ධ විය. ඒ අනුව යුධ ප්‍රයත්නයට සහාය වීම සඳහා හමුදා මුරපොලවල් සහ ගුවන් තොටවල් පිහිටුවන ලදී. ස්වේච්ඡා හමුදා බ්‍රිතාන්‍යයන් විසින් පුහුණු කරන ලද අතර ජනගහනය මත පෙට්‍රල් සලාක ද පනවන ලදී.

1942 අප්‍රේල් මාසයේදී ජපන් ජාතිකයින් මෙරට ප්‍රධාන වරායන් දෙකක් වන කොළඹ සහ ත්‍රිකුණාමලයට ගුවන් ප්‍රහාර එල්ල කළහ. මූල්‍ය හැකියාව තිබූ අය නගරවලින් ඉවත් වූ නමුත් බොහෝ දෙනෙක් රැඳී සිටිමින් දිගටම තම වැඩ කටයුතු වල යෙදුනහ.

10 වසර සිසුන් ඉතිහාසය හැදෑරීම ආරම්භ කරන්නේ ඒකක 1 හි මූලාශ්‍ර විශ්ලේෂණයක් මගිනි. නමුත් මෙම ඒකකයට වාචික ඉතිහාසය ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස ඇතුළත් නොවේ. ඒ අනුව වාචික ඉතිහාසය ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස සිසුන්ට හඳුන්වා දීමට මෙම උපාය මාර්ගය වඩාත් සුදුසු වනු ඇත. එම ගුවන් ප්‍රහාර සහ/හෝ දෙවන ලෝක සංග්‍රාමයේදී ජීවිතය කෙබඳු වුයේද යන්න මතක ඇති ඔවුන්ගේ ප්‍රජාවන්හි ඥාතීන් හෝ අසල්වැසියන් සෙවීම සිසුන්ට පැවරිය හැකිය.

ඉන්පසු ඔවුන් වසර දෙකක කාලය තුළ මෙම උපාය මාර්ගයෙහි විවිධ පියවර අනුගමනය කරනු ඇත. 11 වසරේ සිසුන් 8 වන ඒකක තුලින් ලෝක යුද්ධය අධ්‍යයනය කරයි. එබැවින් මෙවැනි වාචික ඉතිහාස ව්‍යාපෘතියක් 10 වසර සිසුන්ට හඳුන්වා දී එය වසර දෙකක් පැවැත්වීම තුලින් 11 වසරේ එම මාතෘකාවට එළඹීම සෘජු විෂයමාලා යෙදුම්වල කූටප්‍රාප්තිය වනු ඇත. ලෝක යුද්ධය පිළිබඳ ඔවුන්ගේ අධ්‍යයනයේ දී සලකා බැලිය යුතු ඓතිහාසික මූලාශ්‍ර රාශියක් සමඟින්, ශ්‍රී ලංකාවට යුද්ධයෙන් වූ බලපෑම පිළිබඳව සිසුන්ට පුළුල් අදහසක් හා දර්ශනයක් ලැබෙනු ඇත.

එවැනි ව්‍යාපෘතියක උදාහරණයක් සඳහා, බලන්න "The Lankan Lens: World War II Locally."

# IV.



# තෝරාගත් ග්‍රන්ථ නාමාවලිය

Abrams, Linda. Oral history theory. London: Routledge, 2016.

“Best Practices,” Oral History Association, available at:
https://www.oralhistory.org/best-practices/
Accessed December 23, 2021.

Clark, Ella E. *Indian Legends of the Pacific Northwest*. Berkeley: UC Press, 1952.

Clark, Ella E. *Indian Legends of the Northern Rockies*. Norman: University of Oklahoma Press, 1966.

Deloria Jr., Vine. *The World We Used to Live In*. Colorado: Fulcrum Publishing, 2006.

“Equipment and Recording Tips,” UCLA Library, Center for Oral History Research, available at:
https://oralhistory.library.ucla.edu/pages/interview_guidelines
Accessed December 23, 2021.

Portelli, Alessandro. “What makes oral history different,” in *The Oral History Reader*, edited by R. Perks & A. Thomson, 48-58. London: Routledge, 2016.

Ritchie, Donald. *Doing Oral History: A Practical Guide*. NY: Oxford University Press, 2003.

Thompson, Paul. *Voice of the past: Oral history*. Oxford: Oxford University Press, 2000.